**උද්භිද උද්‍යාන භාර අරමුදල 2013**
**-----------------------------------**

උද්භිද උද්‍යාන භාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය සහ කාරක ගිණුම සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ උද්භිද උද්‍යාන භාර අරමුදලේ භාරකරුවන් වන කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් අමාත්‍යාංශයේ ලේකම්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ, මහා භාණ්ඩාගාරයේ අයවැය අධ්‍යක්ෂ සහ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් අතර, 1996 දෙසැම්බර් 20 දින එළඹෙන ලද ගිවිසුමෙහි (4)(ජේ) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරිම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී.අචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරිම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරිමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**-----------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට උද්භිද උද්‍යාන භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**----------------------------------------**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**------------------------**

අරමුදලේ ඍජු ප්‍රතිපාදන උපයෝගී කරගෙන ඉදිකර තිබුණු ගොඩනැගිලිවල ආර්ථිකමය ආයුකාලය සැලකිල්ලට ගනිමින් ක්ෂය අඩුකළ යුතු වුවද, ගොඩනැගිලි සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 (මුදල් ප්‍රවාහ ප්‍රකාශ) අනුව මෙහෙයුම්,ආයෝජන හා මූල්‍යය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහ වෙන වෙනම දැක්වෙන පරිදි අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.650,914 ක් වූ මල් වගා උපදෙස් පොත් තොගය මූල්‍ය ප්‍රකාශනවල රු.698,607 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කාරක ලාභය රු.47,693 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී ටොරින්ටන් සුවහස් මල් සෙවණ ඒකකයේ මල් සහ වෙනත් පැලවලට සිදුවී තිබුණු රු.56,150 ක අලාභය ගිණුම්වලට ගැලපීමෙන් තොරව ඉතිරි තොග ගිණුම්වල දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතැති තොගය සහ සමුච්චිත අරමුදල එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.3 නොසැසඳූ පාලන ගිණුම්**

-----------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබුණු ස්ථාවර වත්කම්වල පිරිවැය හා ස්ථාවර වත්කම් ලේඛනය අතර රු.10,411,863 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා ඇති රු.113,549,907 ක ස්ථාවර වත්කම් විෂයයන් හයකට අදාල උපලේඛන මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

උද්භිද උද්‍යාන භාර අරමුදල පිහිටුවීමේ ගිවිසුමේ 3 (ජී) (1) ඡේදය පරිදි භාරකාර මණ්ඩලය මාස 03 කට වතාවක් රැස්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුලදී රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.89,368,125ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.66,186,911 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.23,181,214 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ප්‍රවේශ පත්‍ර ආදායම රු.7,813,280 කින් වැඩිවීම සහ පුනරාවර්තන වියදම රු.15,301,649 කින් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහත්මත මූල්‍ය සමාලෝචනය**

-------------------------------------

මුළු වත්කම් සමඟ ජංගම වත්කම් සැසඳීමේදී සියයට 46.09 ක් වූ අතර එයින් සියයට 12.05 ක් උපචිත ආදායම් මඟින් නිරූපණය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**4.1 ආර්ථික නොවූ ගනුදෙනු**

-----------------------------

හක්ගල උද්භිද උද්‍යානයේ ඉදිකිරීම් වෙනුවෙන් ලංසු කැඳවීම සඳහා පල කරන ලද පුවත්පත් දැන්වීමෙහි වරදක් නිවැරදි කිරීම සඳහා නැවතත් පුවත්පත් දැන්වීමක් පල කිරීමට සිදුවී තිබුණු අතර, ඒ වෙනුවෙන් රු.47,040 ක් ගෙවා තිබුණි.

## 4.2 නිරවුල් නොකළ බැරකම්

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අවස්ථා 7 කදී රඳවාගෙන තිබුණු ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු වසර 1 ක් ඉක්මවූ අතරුඳවුම් මුදල් රු.3,202,682 ක් වගකීම් කාලය ඉක්මවා ඇතත්, නිරවුල් නොකර ගිණුම්වල දක්වා තිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ කාර්යයන් 5 ක් සඳහා සලසා තිබුණු රු.12,710,000 ක මුළු මූල්‍ය ප්‍රතිපාදනයෙන් රු.11,187,713 ක් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව උපයෝජනය කර තිබුණු මුළු මුදල රු.1,522,287 ක් වූ අතර, එය එක් එක් කාර්යය සඳහා වෙන්කර තිබුණු මූල්‍ය ප්‍රතිපාදනවලින් සියයට 0 සිට 30 අතර පරාසයක පැවතුණි. විස්තර පහත දැක්වේ.

| | කාර්යය | මූල්‍ය ප්‍රතිපාදනය | 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට ගත් ප්‍රතිපාදනය | ඉතිරිය | ප්‍රතිපාදන උපයෝජනය සියයට |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | |
| (i) | උද්‍යාන අලංකරණය | 3,310,000 | 170,120 | 3,139,880 | 5.1 |
| (ii) | නව පොත් සහ මුද්‍රණ ද්‍රව්‍ය මිලදී ගැනීම | 1,000,000 | 70,337 | 929,663 | 7.0 |
| (iii) | ඉඩම් මායිම් නිර්ණය කිරීම | 4,000,000 | 678,720 | 3,321,280 | 17.0 |
| | <u>ජාතික ශාඛාගාරය</u> | | | | |
| (iv) | උද්භිද පර්යේෂණ | 2,000,000 | 603,110 | 1,396,890 | 30.0 |
| (v) | වහල අලුත්වැඩියා කිරීම | 2,400,000 | - | 2,400,000 | 00.0 |
| | | 12,710,000 | 1,522,287 | 11,187,713 | |

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

භාර අරමුදල 1998 වර්ෂයේ සිට ක්‍රියාත්මක වී ඇති අතර සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂවලදී කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.2 ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීම

----------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂය තුල අරමුදලේ ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුයි.

(අ) අයවැය පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) ණයහිමි පාලනය